සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

කෘෂි විද්‍යාව I
விவசாய விஞ்ஞானம் I
Agricultural Science I

08 S I

2018.08.09 / 1300 - 1500

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** ශ්‍රී ලංකාවේ රතු-දුඹුරු පස ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන්නේ,
(1) මැදරට වියළි කලාපයේ ය. (2) පහතරට වියළි කලාපයේ ය.
(3) මැදරට තෙත් කලාපයේ ය. (4) පහතරට තෙත් කලාපයේ ය.
(5) මැදරට අතරමැදි කලාපයේ ය.

**2.** ශාක පෝෂණයේ දී, කෝබෝල්ට් හා සිලිකන් සලකනු ලබනුයේ,
(1) ක්ෂුද්‍ර පෝෂක ලෙස ය. (2) මහා පෝෂක ලෙස ය.
(3) සවල පෝෂක ලෙස ය. (4) අත්‍යවශ්‍ය පෝෂක ලෙස ය.
(5) හිතකර පෝෂක ලෙස ය.

**3.** ශාකයකට නයිට්‍රජන් අවශෝෂණය කරගන්නා ප්‍රධාන ආකාර/ය වනුයේ,
(1) $NO_3^-$ ලෙස ය. (2) $NH_4^+$ ලෙස ය. (3) $NO_2^-$ ලෙස ය.
(4) $NO_3^-$ සහ $NH_4^+$ ලෙස ය. (5) $NO_2^-$ සහ $NO_3^-$ ලෙස ය.

**4.** පහත දැක්වෙන වාරි ජල සම්පාදන ක්‍රම අතුරෙන් ජලය වැඩිපුරම සංරක්ෂණය වන ක්‍රමය වනුයේ,
(1) බිංදු ජල සම්පාදනය ය. (2) බේසම් ජල සම්පාදනය ය.
(3) පිටාර ජල සම්පාදනය ය. (4) ඇලි ජල සම්පාදනය ය.
(5) විසුරුම් ජල සම්පාදනය ය.

**5.** ග්ලයිපොසේට් යනු
(1) ස්පර්ශ, වරණීය වල්නාශකයකි. (2) සංස්ථානික, වරණීය වල්නාශකයකි.
(3) ස්පර්ශ, වරණීය නොවන වල්නාශකයකි. (4) පරිසංක්‍රමණීය, වරණීය වල්නාශකයකි.
(5) සංස්ථානික, වරණීය නොවන වල්නාශකයකි.

**6.** පලතුරු මැස්සා පාලනය සඳහා වඩාත්ම ඵලදායි ක්‍රමය වනුයේ,
(1) ආලෝක උගුල් භාවිතය ය. (2) ෆෙරමෝන උගුල් භාවිතය ය.
(3) කොහොඹ නිස්සාරකය ඉසීම ය. (4) ස්පර්ශ කෘමිනාශක ඉසීම ය.
(5) කෘමි දැල් මගින් පලතුරු මැස්සන් ඇල්ලීම ය.

**7.** බෝග ශාකවල වෛරස් රෝග සාර්ථකව පාලනය කළ හැක්කේ,
(1) ෆෙරමෝන උගුල් භාවිතයෙනි.
(2) ආසාදිත ශාක ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීමෙනි.
(3) රෝග ලක්ෂණ දැකීමෙන් පසු ගෙන්දගම් ඉසීමෙනි.
(4) රෝග ලක්ෂණ දැකීමෙන් පසු ස්පර්ශ කෘමිනාශක ඉසීමෙනි.
(5) රෝග ලක්ෂණ දැකීමෙන් පසු සංස්ථානික කෘමිනාශක ඉසීමෙනි.

**8.** පළිබෝධනාශක විවිධ සූත්‍රායණ (formulations) ලෙස සකසන අතර, තෛලෝදකාරක සාන්ද්‍රණ (EC) යනු එවැනි එක් සූත්‍රායණයකි. වෙළඳපොළෙහි මෙම තෛලෝදකාරක සාන්ද්‍රණ දැකිය හැක්කේ,
(1) කුඩු ආකාරයෙනි. (2) කුට්ටි ආකාරයෙනි. (3) දියර ආකාරයෙනි.
(4) කැට ආකාරයෙනි. (5) තෙත් කළ හැකි කුඩු ආකාරයෙනි.

[ දෙවැනි පිටුව බලන්න.

**9.** පාතිනියම් (*Parthenium hysterophous*) වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,
(1) ආගන්තුක ජලජ පැළෑටියක් ලෙස ය. (2) ආගන්තුක ආක්‍රමණශීලී පැළෑටියක් ලෙස ය.
(3) ඒකදේශික ආක්‍රමණශීලී පැළෑටියක් ලෙස ය. (4) ඒකදේශික ඖෂධ පැළෑටියක් ලෙස ය.
(5) ඌන උපයෝජිත ඖෂධ පැළෑටියක් ලෙස ය.

**10.** තවාන්වල දියමලන් කැමේ (damping off) රෝගයට හේතුකාරක වනුයේ,
(1) වෛරසයකි. (2) දිලීරයකි. (3) බැක්ටීරියාවකි.
(4) ප්‍රොටොසෝවාවෙකි. (5) නෙමටෝඩාවෙකි.

**11.** උත්ස්වේදනය, ශාකවලට
(1) සිසිල්ව පැවතීමට උපකාරී වේ.
(2) වායු හුවමාරුවට උපකාරී වේ.
(3) ප්‍රභාසංස්ලේෂණය වැඩි කිරීමට උපකාරී වේ.
(4) පෝෂක අවශෝෂණයට උපකාරී වේ.
(5) ශූනතා පීඩනය පවත්වා ගැනීමට උපකාරී වේ.

**12.** පැළතුරු ඉඳවීම සඳහා සුලබව යොදාගන්නා ශාක වර්ධක යාමකය වනුයේ,
(1) IAA. (2) IBA. (3) GA3. (4) NAA. (5) Ethylene.

**13.** $C_4$ ශාකයකට උදාහරණයක් වනුයේ,
(1) වී ශාකයයි. (2) බඩ ඉරිඟු ශාකයයි. (3) තක්කාලි ශාකයයි.
(4) සෝයා බෝංචි ශාකයයි. (5) බෝංචි ශාකයයි.

**14.** එළදෙනකගේ ගර්භණී කාලය ආසන්න වශයෙන්
(1) දින 210 කි. (2) දින 280 කි. (3) දින 305 කි. (4) දින 340 කි. (5) දින 360 කි.

**15.** කුකුළන්ගේ ආහාර ජීර්ණක පද්ධතියේ ආහාර, යාන්ත්‍රික ජීර්ණයට භාජනය වන ප්‍රධාන කොටස වනුයේ,
(1) හොට ය. (beak) (2) ගොජුර ය. (crop)
(3) පූර්වාමාශය ය. (proventiculus) (4) වටනය ය. (gizzard)
(5) මහා අන්ත්‍රය ය. (large intestine)

**16.** කුකුළු වර්ග, ඔවුන්ගේ සම්භවය අනුව පන්ති (class) හතරකට වර්ගීකරණය කළ හැකි ය. ඇමරිකානු පන්තියට අයත් වර්ගයකට උදාහරණයක් වනුයේ,
(1) මිනෝකා ය. (2) කෝනිෂ් ය. (3) ඔස්ට්‍රාලෝප් ය.
(4) වයිට් ලෙගෝන් ය. (5) වයිට් ප්ලිමත් රොක් ය.

**17.** බ්‍රොයිලර් කුකුළු පැටවුන් 1000 ක් සඳහා සැකසූ බිම් රක්කවනයක (floor brooder) වර්ගඵලය වනුයේ,
(1) $10\ m^2$ ය. (2) $20\ m^2$ ය. (3) $30\ m^2$ ය. (4) $40\ m^2$ ය. (5) $50\ m^2$ ය.

**18.** සතුන්ගෙන් මිනිසාට බෝවිය හැකි (zoonotic) රෝගයකට උදාහරණයක් වනුයේ,
(1) මැස්ටයිටිස් ය. (2) කිණිතුල් උණ ය. (3) බෘසෙල්ලෝසිස් ය.
(4) කොක්සිඩියෝසිස් ය. (5) සැල්මොනෙල්ලෝසිස් ය.

**19.** ශාකයේ වර්ධනයට ආලෝකයේ ගුණාත්මය බලපායි. ප්‍රභාසංස්ලේෂණය ප්‍රවර්ධනය කරනු ලබන ආලෝක වර්ණ වනුයේ,
(1) නිල් හා රතු වේ. (2) රතු හා කොළ වේ. (3) කහ හා රතු වේ.
(4) නිල් හා දම් වේ. (5) කොළ හා කහ වේ.

**20.** යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP) හා මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) වල අඩංගු පෝෂක ප්‍රමාණයන් පිළිවෙලින්,
(1) 46% N, 45% P හා 60% K වේ. (2) 46% N, 45% $P_2O_5$ හා 60% K වේ.
(3) 46% $NH_4$, 45% P හා 60% $K_2O$ වේ. (4) 46% N, 45% $P_2O_5$ හා 60% $K_2O$ වේ.
(5) 46% $NO_3$, 45% $P_2O_5$ හා 60% $K_2O$ වේ.

**21.** ටෙට්‍රාසෝලියම් පරීක්ෂාව යොදාගන්නේ,
(1) බීජ පාරිශුද්ධතාව නිර්ණය කිරීමට ය. (2) බීජ ජීව්‍යතාව නිර්ණය කිරීමට ය.
(3) බීජ සුප්තතාව නිර්ණය කිරීමට ය. (4) බීජ ප්‍රරෝහණය නිර්ණය කිරීමට ය.
(5) බීජ විෂමජාතියතාව නිර්ණය කිරීමට ය.

**22.** ක්ෂුද්‍ර ප්‍රචාරණයේ දී පූර්වක (ex-plants) මතුපිට ජීවානුහරණය සඳහා යොදාගන්නා රසායනික ද්‍රව්‍යයක් වනුයේ,
(1) ක්ලෝරොක්ස් ය. (2) ෆීනෝල් ය. (3) ෆෝර්මලීන් ය.
(4) ලුණු ද්‍රාවණය ය. (5) සිල්වර් ක්ලෝරයිඩ් ය.

**23.** සමහර ශාක බඳුන් මාධ්‍යයක් (potting media) නොමැතිව වගා කරනු ලැබේ. මෙම වගා ක්‍රමය හොඳින්ම හැඳින්විය හැක්කේ,
(1) භූගත වගාව (*Geoponics*) ලෙස ය. (2) වාගත වගාව ලෙස ය.
(3) ජලගත වගාව ලෙස ය. (4) ඝන මාධ්‍ය වගාව ලෙස ය.
(5) පෝෂක පටල තාක්ෂණය ලෙස ය.

**24.** රිකිලි බද්ධයේ දී,
(1) අනුජය හා ග්‍රාහකය යන දෙකම එකම විශේෂයෙන් විය යුතු ය.
(2) ග්‍රාහකය තෝරාගත යුත්තේ ඉහළ අස්වනු දෙන ප්‍රභේදයකිනි.
(3) ග්‍රාහකය තෝරාගත යුත්තේ පරිණත/පලදරණ ශාකවලින් පමණි.
(4) අනුජය තෝරාගත යුත්තේ පරිණත/පලදරණ ශාකවලින් පමණි.
(5) අනුජය තෝරාගත යුත්තේ ගැඹුරු මූල පද්ධතියක් සහිත මව් ශාකයකිනි.

**25.** බීජ සුප්තතාව යනු,
(1) ප්‍රවේණික පාරිශුද්ධතාව පවත්වාගැනීම සඳහා වූ ස්වභාවික සංසිද්ධියකි.
(2) බීජ ප්‍රරෝහණය ප්‍රවර්ධනය සඳහා වූ ස්වභාවික සංසිද්ධියකි.
(3) බීජ දිගුකල් ගබඩා කර තබාගැනීම සඳහා වූ ස්වභාවික සංසිද්ධියකි.
(4) රෝග හා පළිබෝධ වලක්වාගැනීම සඳහා වූ ස්වභාවික සංසිද්ධියකි.
(5) අයෝග්‍ය කාලගුණික තත්ත්ව මගහැරීම සඳහා වූ ස්වභාවික සංසිද්ධියකි.

**26.** තවාන් බඳුන් මිශ්‍රණයක් තේරීමේ දී සලකා බැලිය යුතු තීරණාත්මක සාධක වනුයේ,
(1) හොඳ ජලවහනය හා හොඳ වාතනය ය.
(2) ජලය රඳාගැනීමේ ධාරිතාව හා හොඳ ජලවහනය ය.
(3) හොඳ ජලවහනය හා ඉහළ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය ය.
(4) හොඳ වාතනය හා ඉහළ ශාක පෝෂක ප්‍රමාණය ය.
(5) ජලය රඳාගැනීමේ ධාරිතාව හා ඉහළ ශාක පෝෂක ප්‍රමාණය ය.

**27.** පුද්ගලයකුගේ පෝෂක අවශ්‍යතාව,
(1) වයස හා ලිංගිකත්වය සමග වෙනස් වන නමුත් කායික ක්‍රියාකාරිත්වය අනුව වෙනස් නොවේ.
(2) වයස හා ලිංගිකත්වය සමග වෙනස් වන නමුත් දේහ උස අනුව වෙනස් නොවේ.
(3) වයස හා දේහ බර සමග වෙනස් වන නමුත් දේහ උස අනුව වෙනස් නොවේ.
(4) කායික ක්‍රියාකාරිත්වය හා වයස අනුව වෙනස් වන නමුත් දේහ ස්කන්ධ දර්ශකය අනුව වෙනස් නොවේ.
(5) කායික ක්‍රියාකාරිත්වය හා දේහ ස්කන්ධ දර්ශකය අනුව වෙනස් වන නමුත් ලිංගිකත්වය අනුව වෙනස් නොවේ.

**28.** එන්සයිම ප්‍රතික්‍රියා නිසා ආහාර නරක්වීමට උදාහරණයක් වනුයේ,
(1) කිරි ඇඹුල් වීම. (2) කිරි කැටි ගැසීම.
(3) පලතුරු මෘදු වීම. (4) පරණ මාළුවල දුර්ගන්ධය.
(5) පලතුරුවල මධ්‍යසාර ගන්ධය.

**29.** "ඉවැඩි හරිතාගාර ආවරණයට" (enhanced green house effect) උදාහරණයක් වනුයේ,
(1) වගුරු බිම්වලින් මීතේන නිදහස් වීම ය.
(2) ගවයන්ගේ රෑමතෙල් ඇරීම (eructation) මගින් මීතේන් නිදහස් වීම ය.
(3) මතුපිට ජලදේහවලින් ජල වාෂ්ප නිදහස් වීම ය.
(4) පොසිල ඉන්ධන දහනය මගින් කාබන්ඩයොක්සයිඩ් නිදහස් වීම ය.
(5) ගිනිකඳු පිපිරීම නිසා ක්ලෝරෝෆ්ලෝරෝකාබන් (CFC) නිදහස් වීම ය.

**30.** ගොවියෙකුට ඔහුගේ හෙක්ටයාර එකක් වූ බෝග වගා ක්ෂේත්‍රයට නයිට්‍රජන් 92 kg ක් යෙදීමට උපදෙස් ලැබිණි. ඔහුගේ බෝග වගා ක්ෂේත්‍රයට අවශ්‍ය යූරියා ප්‍රමාණය වනුයේ,
(1) 50 kg (2) 100 kg (3) 150 kg (4) 200 kg (5) 250 kg

**31.** ප්‍රාථමික බිම් සැකසීමේ ප්‍රධාන අරමුණ වනුයේ,
(1) පස බුරුල් කිරීම හා වල්පැල පාලනය කිරීම ය.
(2) පස මට්ටම් කිරීම හා පාංශු ඛාදනය වැළැක්වීම ය.
(3) පසේ කඩොර ස්තරය (hardpan) කැඩීම හා පස මට්ටම් කිරීම ය.
(4) පාංශු ඛාදනය වැළැක්වීම හා වල් පැළ පාලනය කිරීම ය.
(5) පස හැරවීම හා කාබනික ද්‍රව්‍ය පස සමග මිශ්‍ර කිරීම ය.

**32.** පොහොර යෙදීම සඳහා විසිරුම් ජල සම්පාදනය යොදා **නොගැනීමට** ප්‍රධාන හේතුව වනුයේ,
(1) ජල පොම්ප මලකඩ කෑම ය.
(2) බෝගයේ පත්‍ර මත ලවණ පිළිස්සීම ය.
(3) පොහොර නිසා විසිරුම් හිස් අවහිරවීම ය.
(4) වාරි නළවලින් පොහොර කාන්දුවීම ය.
(5) යෙදීමේ දී පොහොර විශාල ලෙස වාෂ්පශීලී හානිවලට ලක්වීම ය.

**33.** එක්තරා බෝගයක් දිනකට භාවිත කරන ජල ප්‍රමාණය 10 mm ක් නම් හා මෙම බෝගය සඳහා දිනකට 2 cm ක් ජලය සපයන්නේ නම් වාරි ජල කාර්යක්ෂමතාව වනුයේ,
(1) 5 % (2) 20 % (3) 50 % (4) 75 % (5) 100 %

**34.** සාමාන්‍ය උස 40 cm ක් වූ බඩ ඉරිඟු පෙළපතක් සාමාන්‍ය උස 60 cm ක් වූ තවත් බඩ ඉරිඟු පෙළපතක් සමග මුහුන් කරන ලදී. $F_1$ පරම්පරාවේ සාමාන්‍ය උස 75 cm විය. මෙම සංසිද්ධිය හොඳින්ම පැහැදිලි කළ හැක්කේ,
(1) ස්වඅභිජනනයක් ලෙස ය. (2) බාහිර අභිජනනයක් ලෙස ය.
(3) විකෘතියක් ලෙස ය. (4) දෙමුහුම් අභිජනනයක් ලෙස ය.
(5) දෙමුහුම් (hybrid) ඕජයක් ලෙස ය.

**35.** උතුරුමැද පළාතේ මහවැලි පිටාර තැනිවල දක්නට ලැබෙන ස්වභාවික තණ බිම් හැඳින්වෙන්නේ,
(1) විල්ලු ලෙස ය. (2) සැවානා ලෙස ය.
(3) ලඳු කැලෑ (shrublands) ලෙස ය. (4) වියළි පතන ලෙස ය.
(5) තෙත් පතන ලෙස ය.

**36.** පහත දිස්ත්‍රික්ක අතුරෙන් නිදැලි ක්‍රමය යටතේ කිරි ගව නිෂ්පාදනය සඳහා වැඩිම විභවය ඇති දිස්ත්‍රික්කය වනුයේ,
(1) යාපනය ය. (2) මාතර ය. (3) අම්පාර ය.
(4) කුරුණෑගල ය. (5) නුවරඑළිය ය.

**37.** සත්ත්ව පාලනයට බලපාන කාලගුණික සාධක පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) ඉහළ සාපේක්ෂ ආර්ද්‍රතාව සයිලේජ්වල ගුණාත්මය අඩු කරයි.
(2) ඉහළ පාරිසරික උෂ්ණත්වය, බිත්තර දමන කිකිළියන්ගේ ආහාර සලාකයේ ගුණාත්මය අඩු කරයි.
(3) ඉහළ ආර්ද්‍රතාවය නිසා ගොවිපළ සතුන් කෙරෙහි ඉහළ උෂ්ණත්වයේ බලපෑම වැඩි වීමට හැකි ය.
(4) සංවෘත නිවාසවල බ්‍රොයිලර් සතුන්ගේ ආහාර ආගන්තුවට කෙටි දිවා කාලය හානිකර ලෙස බලපෑ හැකි ය.
(5) කෙටි දිවා කාලය හා සුළං සහිත පරිසරය නිසා ගොවිපළ සතුන්ගේ අභිජනන කාර්යක්ෂමතාව අඩු විය හැකි ය.

**38.** කිකිළි බිත්තර රක්කවීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
*A* - රක්කවීම සඳහා සාමාන්‍යයෙන් විශාල බිත්තර ගනු නොලැබේ.
*B* - විශාල බිත්තරවල සැමවිටම කහමද දෙකක් අඩංගු වේ.
*C* - 7 වෙනි දින බිත්තර ආලෝක පරීක්ෂාවට ලක් කිරීමෙන් (candling) අසංසේචිත බිත්තර හඳුනාගත හැකි ය.
*D* - රක්කවීමේ 16 වෙනි දින, බිත්තර ඇසුරුම් කුටීරයෙන් (setter) රක්කවන කුටීරයට (hatcher) මාරු කළ යුතු වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
(1) *A* සහ *B* පමණි. (2) *A* සහ *C* පමණි. (3) *B* සහ *C* පමණි.
(4) *B* සහ *D* පමණි. (5) *C* සහ *D* පමණි.

**39.** සාමාන්‍යයෙන් පාංශු පෝෂක සුලබතාවය
(1) පසෙහි කැටායන හුවමාරු ධාරිතාව (CEC) සමග වෙනස් නොවේ.
(2) පසෙහි CEC වැඩි වන විට අඩු වේ.
(3) පසෙහි pH අගය සමග වෙනස් නොවේ.
(4) පසෙහි pH අගය වැඩිවීම සමග වැඩි වේ.
(5) පසෙහි CEC වැඩිවීම සමග වැඩි වේ.

**40.** පසෙහි ගුණාංග සමහරක් පහත ලැයිස්තු ගත කර ඇත.

*A* - පාංශු pH
*B* - පාංශු තෙතමනය
*C* - පාංශු වාතනය
*D* - පාංශු උෂ්ණත්වය

ඉහත ගුණාංග අතුරෙන්, ශාක පෝෂක අවශෝෂණයට සෘජුවම බලපානුයේ,

(1) *A* සහ *B* පමණි. (2) *B* සහ *C* පමණි. (3) *C* සහ *D* පමණි.
(4) *A*, *B* සහ *C* පමණි. (5) *A*, *B* සහ *D* පමණි.

**41.** උඩරට අර්තාපල් ගොවියෙක් පහත තත්ත්ව වලට මුහුණ දුන්නේ ය.

*A* - අයහපත් කාලගුණය.
*B* - අර්තාපල් පාරිභෝගිකයන්ගේ ආදායම් ඉහළ යාම.

ඉහත තත්ත්වවල ප්‍රතිඵලයක් ලෙස,

(1) අර්තාපල්වල ඉල්ලුම් හා සැපයුම් වක්‍ර දෙකම වමට විතැන් වේ.
(2) අර්තාපල්වල ඉල්ලුම් හා සැපයුම් වක්‍ර දෙකම දකුණට විතැන් වේ.
(3) අර්තාපල්වල ඉල්ලුම් වක්‍රය වමට විතැන් වන අතර අර්තාපල්වල සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.
(4) අර්තාපල්වල ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වන අතර අර්තාපල්වල සැපයුම් වක්‍රය වමට විතැන් වේ.
(5) අර්තාපල්වල ඉල්ලුම් හා සැපයුම් වක්‍ර දෙකට කිසිම වෙනසක් සිදු නොවේ.

**42.** කෘෂිකර්ම අංශය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් කරන ලද මැදිහත්වීම් සමහරක් පහත දී ඇත.

*A* - ඉහළ අස්වනු දෙන ප්‍රභේද හඳුන්වාදීම.
*B* - වියළි කලාපයේ වාරි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
*C* - පොහොර සහනාධාරය ලබාදීම.

ඉහත මැදිහත්වීම් අතුරෙන් හරිත විප්ලවයට සෘජුවම සම්බන්ධ වූයේ,

(1) *A* පමණි. (2) *B* පමණි. (3) *C* පමණි. (4) *A* සහ *B* පමණි. (5) *B* සහ *C* පමණි.

**43.** ගොවිපලක මුළු පිරිවැය (TC), $TC = 100 + 5Q + 0.1Q^2$ ලෙස දී ඇත.
මෙහි Q යනු නිමැවුම් ඒකක සංඛ්‍යාව වේ. Q = 10 වන විට ස්ථාවර පිරිවැය හා විචල්‍ය පිරිවැය වනුයේ පිළිවෙළින්,

(1) 10 සහ 16 වේ. (2) 10 සහ 60 වේ. (3) 100 සහ 50 වේ. (4) 100 සහ 60 වේ. (5) 100 සහ 160 වේ.


**44.** වෙළඳපොළ ව්‍යුහ දෙකක් පහත දැක්වේ.


*A* - වී වෙළඳපොළ : ශ්‍රී ලංකාවේ වී වෙළඳපොළෙහි විශාල සංඛ්‍යාවක් නිෂ්පාදකයන් හා මිලදී ගන්නන් සිටින අතර නිෂ්පාදන සමජාතීය ලෙස සැලකේ.
*B* - අන්තර්ජාල සේවා වෙළඳපොළ : ශ්‍රී ලංකාවේ තරඟකාරී අන්තර්ජාල පහසුකම් සපයන්නන් සංඛ්‍යාව 10 කට වඩා අඩු වන අතර වෙළඳපොළට ඇතුල්වීම සඳහා සාමාන්‍යයෙන් බාධක පවතී.

මෙම වෙළඳපොළ ව්‍යුහ දෙක පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) *A* වෙළඳපොළ ඒකාධිකාරයක් වන අතර *B* වෙළඳපොළ කතිපයාධිකාරයකි.
(2) *A* වෙළඳපොළ කතිපයාධිකාරයක් වන අතර *B* වෙළඳපොළ ඒකාධිකාරයකි.
(3) *A* වෙළඳපොළ කතිපයාධිකාරයක් වන අතර *B* වෙළඳපොළ පූර්ණ තරඟයකි.
(4) *A* වෙළඳපොළ පූර්ණ තරඟයක් වන අතර *B* වෙළඳපොළ කතිපයාධිකාරයකි.
(5) *A* වෙළඳපොළ පූර්ණ තරඟයක් වන අතර *B* වෙළඳපොළ ඒකාධිකාරයකි.

**45.** පහත රූප සටහන යොදා ගනිමින් දී ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.




ඉහත රූප සටහනට අනුව, *A* සහ *B* හි ඉල්ලුමේ මිල නම්‍යතාව පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) *A* අනම්‍ය වන අතර *B* නම්‍ය වේ.
(2) *A* නම්‍ය වන අතර *B* අනම්‍ය වේ.
(3) *A* ඒකීය නම්‍ය වන අතර *B* පූර්ණව නම්‍ය වේ.
(4) *A* පූර්ණව අනම්‍ය වන අතර *B* පූර්ණව නම්‍ය වේ.
(5) *A* පූර්ණව නම්‍ය වන අතර *B* පූර්ණව අනම්‍ය වේ.

**46.** ව්‍යාපාර සැලසුමක ප්‍රධාන කොටස් හතර වනුයේ,

(1) තාක්ෂණික සැලැස්ම, නිෂ්පාදන සැලැස්ම, යෙදවුම් සැපයුම් සැලැස්ම හා අලෙවි සැලැස්ම වේ.
(2) තාක්ෂණික සැලැස්ම, සමාජීය සැලැස්ම, මානව සම්පත් කළමනාකරණ සැලැස්ම හා අලෙවි සැලැස්ම වේ.
(3) තාක්ෂණික සැලැස්ම, මානව සම්පත් කළමනාකරණ සැලැස්ම, අලෙවි සැලැස්ම හා මූල්‍ය කළමනාකරණ සැලැස්ම වේ.
(4) තාක්ෂණික සැලැස්ම, නිෂ්පාදන සැලැස්ම, ස්වභාවික සම්පත් කළමනාකරණ සැලැස්ම හා අලෙවි සැලැස්ම වේ.
(5) තාක්ෂණික සැලැස්ම, නිෂ්පාදන සැලැස්ම, මානව සම්පත් කළමනාකරණ සැලැස්ම, හා අලෙවි සැලැස්ම වේ.

**47.** පරිණත වීමේදී වී ඇට තුළ සිදුවන්නා වූ වෙනස්වීම් කිහිපයක් පහත දැක්වේ.

*A* - ජලය ප්‍රමාණය අඩු වීම.
*B* - මිදය දෘඩ වීම.
*C* - බීජාවරණයේ වර්ණය වෙනස් වීම.

ඉහත සිදුවීම් අතුරෙන්, වී ගබඩා කිරීමේ දී පසු අස්වනු හානිය අඩු කිරීමට වැඩියෙන්ම දායක වන්නේ,

(1) *A* පමණි. (2) *B* පමණි. (3) *C* පමණි. (4) *A* සහ *B* පමණි. (5) *B* සහ *C* පමණි.

**48.** ගොවින්ට පොහොර සහනාධාරය ලබාදීමේ වගකීම ඇත්තේ

(1) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ය.
(2) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ය.
(3) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ය.
(4) කෘෂිකර්ම සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයට ය.
(5) හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට ය.


**49.** ශිෂ්‍යයෙක් සිය ක්ෂේත්‍ර සටහන් පොතෙහි පහත කරුණු සටහන් කර තිබුණි.

*A* - ඇතුල් කාන්දුව අඩු වී ඇත.
*B* - පස මිශ්‍ර වී ඇත.
*C* - පාංශු ක්ෂුද්‍ර ජීවී ක්‍රියා උත්තේජනය වී ඇත.

ඉහත කරුණු අතුරෙන්, පාංශු සෞඛ්‍යය දියුණු කිරීම සඳහා ගැඩවිලුන් දායක වන්නේ,

(1) *A* සඳහා පමණි. (2) *B* සඳහා පමණි.
(3) *A* සහ *B* සඳහා පමණි. (4) *A* සහ *C* සඳහා පමණි.
(5) *B* සහ *C* සඳහා පමණි.

**50.** පහත රූප සටහන යොදාගනිමින් දී ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.




ඉහත බෝග වගා පද්ධතින්ගේ ශාකපැටි (hedgerows) සංස්ථාපනය කිරීමට වඩාත් සුදුසු ශාක වර්ගය කුමක් ද?

(1) හෙමින් වර්ධනය වන රනිල ශාක
(2) ශීඝ්‍රයෙන් වර්ධනය වන රනිල ශාක
(3) හෙමින් වර්ධනය වන රනිල නොවන ශාක
(4) ශීඝ්‍රයෙන් වර්ධනය වන රනිල නොවන ශාක
(5) කේතුකාකාර වියනක් සහිත ඕනෑම ශාක විශේෂයක්

※ ※ ※

AL/2018/08/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

කෘෂි විද්‍යාව II
விவசாய விஞ்ஞானம் II
Agricultural Science II

08 S II

2018.08.11 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ..................................

**උපදෙස් :**

※ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **10** කින් සහ ප්‍රශ්න **10** කින් සමන්විත වේ.

※ මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත වන අතර කොටස් **දෙකට ම** නියමිත කාලය **පැය තුනකි.**

**A කොටස – ව්‍යුහගත රචනා (පිටු අංක 2 - 9)**

※ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.

※ ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු **නො වන** බව ද සලකන්න.

**B කොටස – රචනා (පිටු අංක 10)**

※ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A** සහ **B** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

※ ප්‍රශ්න පත්‍රයේ **B** කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

(08) කෘෂි විද්‍යාව - II

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |
| ප්‍රතිශතය | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

**සංකේත අංක**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය කළේ | |

[ දෙවැනි පිටුව බලන්න.

**A කොටස - ව්‍යුහගත රචනා**

**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය **10** කි.)

මෙම තීරුවේ කිසිවක් නොලියන්න

**1.** (A) වල් පැළෑටි, ජලය හා පෝෂක සඳහා බෝග සමග තරග කර බෝග අස්වැන්න අඩු කරයි.

(i) රූපාණු විද්‍යාත්මක ලක්ෂණ අනුව, වල් පැළෑටි පන්ති **තුන** සඳහන් කරන්න.

(1) ..................................................................

(2) ..................................................................

(3) ..................................................................

(ii) "සමෝධානික වල් පැළ කළමනාකරණය" අර්ථ දක්වන්න.

..................................................................

..................................................................

..................................................................

(iii) ශාක තුළ වල්නාශක ක්‍රියාකිරීමේ යාන්ත්‍රණය පදනම් කරගෙන වල්නාශක ආකාර **දෙක** සඳහන් කරන්න.


(1) ..................................................................

(2) ..................................................................

(iv) ඉහත වල්නාශක ආකාර දෙක අතුරෙන්, ඇටවරා (*Panicum repens*) පාලනයට වඩාත් සුදුසු ආකාරය කුමක් ද?

..................................................................

(B) ප්‍රශ්න අංක (i) සිට (vii) දක්වා පිළිතුරු සැපයීමට පහත රූප සටහන යොදාගන්න.




(i) ප්‍රචාරණය සඳහා ඉහත අතු කැබැල්ල ලබාගැනීමට තෝරා ගන්නා මාතෘ ශාකයේ තිබිය යුතු වැදගත් ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(1) ..................................................................

(2) ..................................................................

(ii) මාතෘ ශාකයෙන් මෙම අතු කැබැල්ල කපාගැනීම සඳහා යොදාගන්නා පිහිය, තියුණු හා පිරිසිදු විය යුත්තේ ඇයි?

..................................................................

..................................................................

(iii) මෙම අතු කැබැල්ල ආසන්න වශයෙන් කොපමණ දිග විය යුතු ද?

..................................................................

[තුන්වැනි පිටුව බලන්න.

මෙම තීරුවේ කිසිවක් නොලියන්න

(iv) මුල් හටගැනීම ප්‍රවර්ධනය සඳහා අතු කැබැල්ලට කළ යුතු ප්‍රතිකාරය කුමක් ද?

.............................................................................................................

(v) අතු කැබැල්ලේ පහළ පත්‍ර ඉවත් කිරීමට අවශ්‍ය වන්නේ ඇයි?

.............................................................................................................


(vi) අතු කැබැල්ලේ ඉතිරිව ඇති පත්‍රවල අඩක් ඉවත් කළ යුත්තේ ඇයි?

.............................................................................................................

(vii) අතු කැබැල්ලේ ඉතිරිව ඇති පත්‍රවල අඩක් ඉතිරි කළ යුතු වන්නේ ඇයි?

.............................................................................................................

(C) ප්‍රශ්න අංක (i) සිට (iii) දක්වා පිළිතුරු සැපයීමට පහත රූප සටහන යොදාගන්න.




(i) ඉහත වගා පද්ධතිය නම් කරන්න.

.............................................................................................................

(ii) ආහාර සුරක්ෂිතතාව සම්බන්ධව මෙම වගා පද්ධතියේ ඇති වාසි **දෙකක්** සඳහන් කරන්න.

(1) .............................................................................................


(2) .............................................................................................

(iii) ස්වභාවික සම්පත් භාවිතය සම්බන්ධව, මෙම වගා පද්ධතියේ ඇති වාසි **දෙකක්** සඳහන් කරන්න.

(1) .............................................................................................

(2) .............................................................................................

(D) ප්‍රශ්න අංක (i) සිට (iii) දක්වා පිළිතුරු සැපයීමට පහත රූප සටහන යොදාගන්න.



(i) ඉහත අභිජනන ක්‍රමයේදී යොදාගන්නා ලද පරාගන ක්‍රමය නම් කරන්න.

..........................................................................................

(ii) ඉහත අභිජනන ක්‍රමයේදී, පසු පරම්පරා ක්‍රමක්‍රමයෙන් මිටි වන්නේ ඇයි?

..........................................................................................

(iii) මෙම අභිජනන ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණ කුමක් ද?

..........................................................................................

(iv) "දෙමුහුම් (hybrid) දිරිය" අර්ථ දක්වන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

**2.** (A) දෘශ්‍ය ඝනත්වය, පසක වැදගත් භෞතික ලක්ෂණයක් ලෙස සැලකේ.

(i) පාංශු දෘශ්‍ය ඝනත්වය (bulk density) යනු කුමක් ද?

..........................................................................................

..........................................................................................

..........................................................................................

(ii) ගොවියෙකුට පසක දෘශ්‍ය ඝනත්වය පිළිබඳ දැනුමක් තිබීමේ ප්‍රධාන වාසි **හතරක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

(iii) එක්තරා පසක දෘශ්‍ය ඝනත්වය මැනීම සඳහා සිදු කරනු ලැබූ පරීක්ෂණයකදී, ගැල්වනයිස් බටයක් යොදාගෙන පස් නියැදියක් ගෙන එය බඳුනක තබා නියත බරක් ලැබෙන තෙක් උඳුනක වියළන ලදී.

පස් නියැදියේ හා බඳුනේ බර = 150 g
බඳුනේ බර = 100 g
පස් නියැදියේ පරිමාව = 5 $cm^3$

පසෙහි දෘශ්‍ය ඝනත්වය ගණනය කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(B) ශ්‍රී ලංකාවේ ඇති බහු වාර්ෂික බෝග පිළිබඳ පර්යේෂණ ආයතන **තුනක්**, ඒවා පිහිටි ස්ථාන සමග සඳහන් කරන්න.

| **පර්යේෂණ ආයතනයේ නම** | **පිහිටි ස්ථානය** |
|---|---|
| (i) .............................................. | .................................... |
| (ii) .............................................. | .................................... |
| (iii) .............................................. | .................................... |

(C) බෝගවලට වැළඳෙන රෝග සහ පෝෂක ඌනතාවයන් ඒවායේ පූර්ව හා පසු අස්වනු හානිවලට හේතු විය හැකි ය.

(i) ඌනතාවයකින්, රෝගයක් වෙන් කර දක්වන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................


(ii) පහත එක් එක් රෝග ව්‍යාප්ත වන ආකාරයට උදාහරණයක් ලෙස රෝගයක් බැගින් නම් කරන්න.

(1) බීජ මගින් ..........................................................................

(2) පස මගින් ..........................................................................

(3) වාතය මගින් ..........................................................................

(D) පහත රූප සටහනෙන් භෞතික භූමි වර්ගීකරණය දැක්වේ. ප්‍රශ්න අංක (i) සිට (iv) දක්වා පිළිතුරු සැපයීමට මෙම රූප සටහන යොදාගන්න.




ඉහත රූප සටහනෙහි දක්වා ඇති පහත භූමි පන්තිවල භූමියේ ස්වභාවය හා වගා කිරීමට සුදුසු බෝගයකට උදාහරණයක් බැගින් සඳහන් කරන්න.

| | **භූමි පන්තිය** | **භූමියේ ස්වභාවය** | **සුදුසු බෝගය** |
|---|---|---|---|
| (i) | 1 | .................................... | .................................... |
| (ii) | 2 | .................................... | .................................... |
| (iii) | 5 | .................................... | .................................... |
| (iv) | 8 | .................................... | .................................... |


(E) ශාක හෝර්මෝනයක් අර්ථ දැක්වීමේදී යොදාගන්නා ප්‍රධාන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

(i) ..........................................................................................................

(ii) ..........................................................................................................

(iii) ..........................................................................................................

(F) විවිධ පාංශු වයන පන්තීන්ගේ පාංශු ජල ප්‍රමාණය පහත ප්‍රස්තාරයේ දැක්වේ. ප්‍රශ්න අංක (i) හා (ii) ට පිළිතුරු සැපයීමට මෙම රූප සටහන යොදාගන්න.




(i) ඉහත ප්‍රස්තාරයේ P ප්‍රදේශයේ දක්නට ලැබෙන ජල ප්‍රමාණය නම් කරන්න.

..........................................................................................

(ii) ඉහත ප්‍රශ්න අංක (i) හි නම් කළ ජලය වැඩිම ප්‍රමාණයක් සහිත පාංශු වයන පන්තිය නම් කරන්න.

..........................................................................................

**3.** (A) ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ මහා පරිමාණ කිරි ගව ගොවිපොළ බැගින් නම් කරන්න.


(i) රාජ්‍ය අංශයේ මහා පරිමාණ කිරි ගව ගොවිපොළක් :

..........................................................................................

(ii) පෞද්ගලික අංශයේ මහා පරිමාණ කිරි ගව ගොවිපොළක් :

..........................................................................................

(B) වාණිජ බ්‍රොයිලර් කුකුල් නිෂ්පාදනයේදී යොදාගන්නා අභිජනන ක්‍රමයක් පහත රූප සටහනෙහි දැක්වේ.




(i) ඉහත අභිජනන ක්‍රමය නම් කරන්න.

..........................................................

(ii) $F_1$ පරම්පරාව, වාණිජ බ්‍රොයිලර් සතුන් ලෙස යොදාගැනීමේ ප්‍රධාන හේතුව ලියන්න.

..........................................................................................

(C) කුකුළු ආහාර සලාකවල ශක්ති පරිපූරක ලෙස යොදා ගත හැකි ආහාර ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

(i) ........................................

(ii) ........................................

(D) හොඳ ගුණාත්මයෙන් යුත් තෘණ සයිලේජ්වල ඇති ගති ලක්ෂණ **දෙකක්** ලැයිස්තු ගත කරන්න.

(i) ........................................

(ii) ........................................

(E) බිජුලන කිකිළියන් රංචුවකින් (Layer flock) පිරිසිදු බිත්තර ලබාගැනීම සඳහා අවශ්‍ය වැදගත් කළමනාකරණ ක්‍රියා **දෙකක්** ලියන්න.

(i) ........................................


(ii) ........................................

(F) රක්කවීම සඳහා සුදුසු බිත්තර තේරීමේදී භාවිත කළ හැකි බාහිර ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(i) ........................................

(ii) ........................................

(G) එළදෙනකගේ ස්ථන පද්ධතියේ අභ්‍යන්තර ව්‍යුහය පහත රූප සටහනේ දැක්වේ. ප්‍රශ්න අංක (i) සිට (iv) දක්වා පිළිතුරු සැපයීමට මෙම රූප සටහන යොදාගන්න.




ඉහත රූප සටහනෙහි **P**, **Q**, **R** හා **S** ලෙස දක්වා ඇති කොටස් නම් කරන්න.

(i) **P** ....................

(ii) **Q** ....................

(iii) **R** ....................

(iv) **S** ....................

(H) විවිධ රෝග කාරකයන් නිසා සතුන්ට රෝග වැළඳේ. පහත සඳහන් එක් එක් රෝගී තත්ත්වයන්ට හේතු වන රෝග කාරකය නම් කරන්න.

(i) ගවයන්ගේ කිරි උණ : ........................................

(ii) කුකුළන්ගේ කොක්සිඩියොසිස් : ........................................

(iii) ගවයන්ගේ කුර හා මුඛ රෝගය : ........................................

(iv) කුකුළන්ගේ ගම්බෝරෝ රෝගය : ........................................

(I) ශීතකරණ තත්ත්ව යටතේ ගබඩා කර තැබූ විට, පලතුරු හා එළවළු වල පසු අස්වනු හානි අඩුවීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.

(i) ..........

(ii) ..........

(J) ආහාර ඇසුරුම්කරණයේ ප්‍රධාන වාසි **දෙකක්** සඳහන් කරන්න.

(i) ..........

(ii) ..........

(K) 1980 අංක 26 දරණ ආහාර පනතේ, ආහාර ලේබල් කිරීමේ නියෝගය අනුව, ආහාර ලේබලයේ ප්‍රධාන මඩලේ (panel) සඳහන් කළ යුතු අනිවාර්යය තොරතුරු **දෙකක්** ලියන්න.

(i) ..........

(ii) ..........

**4.** (A) බෝගයකට 5:10:10 පොහොර පන්තියේ පොහොර මිශ්‍රණය යෙදීමට නිර්දේශිතව ඇත. ඉහත පොහොර මිශ්‍රණයෙන් 100 kg සැකසීමට අවශ්‍ය යූරියා, ත්‍රිත්ව සුපර්පොස්පේට් හා මියුරේට්ඔෆ්පොටෑෂ් ප්‍රමාණ ගණනය කරන්න.

(i) යූරියා (kg)

..........

..........

(ii) ත්‍රිත්ව සුපර්පොස්පේට් (kg)

..........

..........

(iii) මියුරේට්ඔෆ්පොටෑෂ් (kg)

..........

..........

(B) උද්‍යාන බෝග හා කෘෂිකාර්මික ප්‍රචාරණයේදී වර්ධක ප්‍රචාරණය බහුලව යොදා ගනු ලැබේ. පහත දක්වා ඇති බෝග ප්‍රචාරණය සඳහා බහුලව යොදා ගනු ලබන ප්‍රචාරණ ව්‍යුහ සඳහන් කරන්න.

| | **බෝගය** | **ප්‍රචාරණ ව්‍යුහ ආකාරය** |
|---|---|---|
| (i) | කැනාස් (cannas) | .......... |
| (ii) | ඩේලියා | .......... |
| (iii) | ක්‍රෝටන් | .......... |
| (iv) | අඹ | .......... |
| (v) | කෙසෙල් | .......... |

(C) බීජ සුප්තතාව බිඳීම සඳහා විවිධ බීජ ප්‍රතිකර්ම යොදනු ලැබේ. පහත එක් එක් බීජවල සුප්තතාව බිඳීම සඳහා වඩාත් යෝග්‍ය බීජ ප්‍රතිකර්මය සඳහන් කරන්න.

| | **බීජ වර්ගය** | **බීජ ප්‍රතිකාර ආකාරය** |
|---|---|---|
| (i) | දඹල | .......... |
| (ii) | වී | .......... |
| (iii) | අඹ | .......... |
| (iv) | තක්කාලි | .......... |

[නවවැනි පිටුව බලන්න.

මෙම තීරුයේ කිසිවක් නොලියන්න

(D) බොහෝ ශ්‍රී ලාංකිකයෝ රතු ළූණුවලට ආදේශකයක් ලෙස ලොකු ළූණු යොදා ගනිති. එක්තරා වගා කන්නයකදී රතු ළූණු බෝග වගාව බරපතල ලෙස දිලීර රෝගයකින් හානි වූ නමුත්, ඉන් ලොකු ළූණු වගාවට බලපෑමක් නොවීය.

(i) ලොකු ළූණුවල සැපයුම් වක්‍රයට කුමක් සිදුවේ ද?

.............................................................................................................

(ii) ලොකු ළූණුවල ඉල්ලුම් වක්‍රයට කුමක් සිදුවේ ද?

.............................................................................................................

(iii) ලොකු ළූණුවල සමතුලිත මිලට කුමක් සිදුවේ ද?

.............................................................................................................

(E) එක්තරා නිෂ්පාදන ක්‍රියාවලියක යෙදවුම් හා ඊට අනුරූප නිමැයුම් පහත දී ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| **යෙදවුම් ඒකක ප්‍රමාණය** | 1 | 2 | 3 | 4 | 5 |
| **නිමැයුම් ඒකක ප්‍රමාණය** | 20 | 50 | 90 | 120 | 140 |

(i) යෙදවුම් ඒකක 4 ක් භාවිත කරන විට සාමාන්‍ය නිෂ්පාදනය කොපමණ ද?

.............................................................................................................

(ii) යෙදවුම් ඒකක 4 සහ 5 අතර ප්‍රමාණයක් භාවිත කරන විට ආන්තික නිෂ්පාදනය කොපමණ ද?

.............................................................................................................

(iii) දර්ශීය නිෂ්පාදන ක්‍රියාවලියක දී, ආන්තික නිෂ්පාදනය ශූන්‍ය වන විට, මුළු නිෂ්පාදනයට කුමක් සිදුවේ ද?

.............................................................................................................

(F) හරිත විප්ලවය තුළින් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයට ධනාත්මක හා සෘණාත්මක බලපෑම් ලැබී ඇත.

(i) හරිත විප්ලවයේ ධනාත්මක බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.

(1) .............................................................................................................

(2) .............................................................................................................

(ii) හරිත විප්ලවයේ සෘණාත්මක බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.

(1) .............................................................................................................

(2) .............................................................................................................

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

කෘෂි විද්‍යාව II
விவசாய விஞ்ஞானம் II
Agricultural Science II

08 S II

## B කොටස - රචනා

උපදෙස් :
- ※ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
- ※ අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය **15** කි.)

**5.** (i) ශ්‍රී ලංකාවේ පහතරට, ආරක්ෂිත ශාක ගෘහ තුළ පරිසර සාධක පාලනය කිරීම සඳහා වඩාත් බහුලව යොදාගනු ලබන ශිල්පීය ක්‍රම විස්තර කරන්න.

(ii) රෝගී ගොවිපොළ සතුන්ගේ පොදු රෝග ලක්ෂණ සඳහන් කරන්න. සත්ත්ව ගොවිපොළක රෝග පාලනය සඳහා ගත හැකි පූර්වෝපායයන් කවරේ ද?

(iii) ආහාර බෝගවල පසු අස්වනු හානිය පාලනය සඳහා උචිත අස්වනු නෙලන ක්‍රම හා අප්‍රමාදව පසු අස්වනු ප්‍රතිකාර කිරීමේ වැදගත්කම, උදාහරණ සඳහන් කරමින් පැහැදිලි කරන්න.

**6.** (i) අනෙකුත් වර්ධක ප්‍රචාරණ ක්‍රමවලට සාපේක්ෂව, අතු බැඳීමේ වාසි සඳහන් කර අතු බැඳීමේදී මුල් හටගැනීමේ කායික විද්‍යාත්මක ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(ii) කිරි ගොවියන් විසින් යොදාගනු ලබන විවිධ කිරි දෙවීමේ ක්‍රම පැහැදිලි කරන්න.

(iii) ආහාර පරිරක්ෂණය සඳහා උෂ්ණත්වය නියාමනය කිරීමේ විවිධ යොදාගැනීම් උදාහරණ සහිතව විස්තර කරන්න.

**7.** (i) දේශීය තත්ත්ව යටතේ ගවයන්ගේ ස්වභාවික සංසර්ගයට සාපේක්ෂව කෘත්‍රිම සිංචනයේ ඇති වාසි හා අවාසි විස්තර කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ සහල්වල ඉල්ලුම හා සැපයුමට බලපාන සාධක විස්තර කරන්න.

(iii) ඉහළ හරිතාගාර ආචරණය (Enhanced green house effect) යනු කුමක් ද? ඉහළ හරිතාගාර ආචරණයට හේතු පැහැදිලි කරන්න.

**8.** (i) පාංශු ඛාදනයේ බලපෑම් විස්තර කරන්න.

(ii) පොහොර කාර්යක්ෂමතාව වැඩි කිරීමට ප්‍රායෝගිකව යොදාගත හැකි උපාය මාර්ග විස්තර කරන්න.

(iii) කෘෂිකාර්මික භූමිවල භාවිත කරනු ලබන විවිධ ජලවහන සැලසුම් විස්තර කරන්න.

**9.** (i) බෝග නිෂ්පාදනයේ ප්‍රායෝගික භාවිතාවන් පැහැදිලි කරමින් විශේෂ තවාන් විස්තර කරන්න.

(ii) බීජ ප්‍රතිකාරවල අරමුණු උදාහරණ සහිතව විස්තර කරන්න.


(iii) බෝගවල උත්ස්වේදනය පාලනය කිරීමට යොදාගන්නා විවිධ ක්‍රම විස්තර කරන්න.

**10.** (i) වල් පැලෑටි පාලනය කරන විවිධ ක්‍රම විස්තර කරන්න.

(ii) උචිත උදාහරණයක් යොදාගනිමින් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාරයක් සඳහා ව්‍යාපාර සැලසුමක් සකසා ගන්නා ආකාරය විස්තර කරන්න.

(iii) පරිසරයට හානිදායක බලපෑම් ඇති කරන කෘෂිකාර්මික ක්‍රියා සඳහන් කර, එම බලපෑම් ලිහිල් කරගැනීමේ ක්‍රම විස්තර කරන්න.

※ ※ ※



වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න
LOL
Book Store
25% OFF
ALL BOOKS
Including Exercise Books,
CR Books, and B5 Books
ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්
ORDER BOOKS FROM LOL BOOKS STORE
0372060110
WWW.LOL.LK
071 777 4440 (WhatsApp)
Cash On Delivery Available

# ORDER A/L TERM TEST PAPERS, SHORT NOTES, WORKBOOKS & REVISION BOOKS

SINHALA, ENGLISH & TAMIL MEDIUM



# LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

0717774440 (WHATSAPP)

WWW.LOL.LK